**කොළඹ විශ්වවිද්‍යාලය - 2021**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා වසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, හෝ විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව අනුමත කරනු ලබන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නිවැරදි කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර පූර්ව කාලපරිච්ඡේදවල වැරදි නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට හා එදිනට සමුච්චිත ක්ෂයට පිළිවෙළින් එකතුව රු.52,289,239 ක් හා එකතුව රු.154,222,233 ක් ගැලපීම් කර තිබුණි. | එසේ ගැළපුම් සටහන් යෙදීමට හේතු වූයේ පෙර වසරේ විගණන වාර්තාව අනුව නිර්දේශ කරන ලද ගැළපීම් හා පෙර වසරේ එකතු අයිතම ලෙස ඇතුලත් කළ වත්කම් මෙම වසරේ වෙන වෙනම අයිතමයන් ලෙස ගිණුම්කරණ පද්ධතියට ඇතුළත් කර ගත යුතු වූ නිසාය. තවද වත්කම් ඇතුළත් කිරීමේදී සිදු වන දෝෂ නිවැරදි කිරීමටද මෙම ගැළපුම් සටහන් යොදා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ | පුස්තකාල පොත් හා සඟරා 250,000 ක් පමණ වන ප්‍රමාණයක් ඇති අතර එම පොත් වල | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.372,651,424 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රමිතයේ 92 ඡේදය ප්‍රකාරව මෙවැනි වත්කම් පිළිබඳව හෙළිදරව් කිරීම් සිදුකරද නොතිබුණි. | අන්තර්ගතය අනුව ඒවායේ ප්‍රයෝජනවත් ජීවිතකාලය ඇගයීම අනෙකුත් වත්කම් මෙන් ප්‍රායෝගිකව කිරීම අපහසුය. ප්‍රයොජනවත් ජීවකාලය ඇගයීම සඳහා පත්කරනලද විශේෂ කමිටුව මගින් විවිධ හේතුන්මත ඉදිරි අපේක්ෂිත ප්‍රයොජනවත් ජීවකාලයක් නිර්දේශ නොකරනලද අනෙකුත් වත්කම්වලට අදාල ගැලපීම් නිර්දේශිත පරිදි 2022 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.891,715,586 ක ප්‍රාග්ධන ප්‍රදාන හා රු.25,307,476 ක තෑගි හා පරිත්‍යාග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | ප්‍රාග්ධන ප්‍රදාන හා තෑගි හා පරිත්‍යාග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත 11 හි 80 වන ඡේදය අනුව කටයුතු කර ඇත. තවද මෙම ප්‍රමිතය 01-01-2018 සිට ක්‍රියාත්මක අතර එම දිනයේ සිට සෑම වසරකම ඊට අනුරූපව ක්‍රියාත්මක කර ඇත. මෙම මුදල් මෙම ප්‍රමිතය අනුව ප්‍රදානය වීමට නම් ප්‍රදාන ගිවිසුමක් තිබිය යුතුය. මෙම ප්‍රමිතියෙන් විශ්වවිද්‍යාල අනුගමනය කර නොමැති යැයි විගණනය විසින් පෙන්වා දෙන්නේ නම් ගිණුම් වලට සටහනක් ලෙස ඉහත ප්‍රමිතිය අනුගමනය කර නොමැති බව හෙළිදරව් කිරීමට එකඟ වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ආරම්භ කර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කර තිබුණු පාඨමාලා 39 කට අදාළ රු.58,551,241 ක් වූ පාඨමාලා ආදායම් අදාළ වර්ෂයේ ආදායම් ලෙස නිවැරදිව හඳුනානොගැනීම හේතුවෙන් ඒ ඒ වර්ෂයට අදාළ ආදායම අඩුවෙන් හා 2021 දෙසැම්බර් 31 දිනට විලම්භිත ආදායම රු.58,551,241 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පාඨමාලා සම්බන්ධීකාරකගේ එකඟතාවය මත පාඨමාලා 26 ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී ගිණුම වසාදැමීමටත් පාඨමාලා 6ක් සක්‍රීය තත්වයේ පවත්වාගෙන යෑමටත් නියමිත අතර පාඨමාලා 7 ක් සම්බන්ධයෙන් සම්බන්ධීකාරකගේ තහවුරුව ලැබී නොමැත. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතන දෙකකින් වර්ෂ 03 කට වැඩි කාලයක සිට අයවිය යුතු එකතුව රු.7,640,438 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | ලබා දී තිබූ ණය මුදල ගෙවන ලෙස දන්වා ඇති අතර එම ආයතනය විසින් ණය ගෙවීමේ කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇත. | කඩිනමින් මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධ්‍යයන කටයුතු සඳහා විදේශගතවී තිබුණු අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් 24 දෙනෙකු විශ්වවිද්‍යාලය සමඟ එළඹි ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.85,640,251 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | අදාළ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, ලිපි මගින් දැනුවත් කිරීම, ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම, අර්ථසාධක අරමුදලින් අයකර ගැනිමට කටයුතු කිරීම හා වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම යනාදී විවිධ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ගිවිසුම්ගත පරිදි අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1996 ජුනි 20 දිනැති අංක 928/16 දරන ගැසට් නිවේදනය | ශ්‍රීපාලි මණ්ඩපය සඳහා අධ්‍යයන පීඨ 02 ක් පිහිටුවීමකින් තොරව අධ්‍යනාංශ 02 ක් සඳහා උපාධි අපේක්ෂකයින් බඳවාගෙන භාෂා සහ පරිගණක පාඨමාලා සඳහා උපාධි ලබාදී තිබුණි. | 1996 ජුනි 20 දරන ගැසට් නිවේදනය අනුව ශ්‍රී පාලි මණ්ඩපය සඳහා අධ්‍යයන පීඨ 02ක් පිහිටුවිම සඳහා අවශ්‍ය කටයුතු 2014 වසරේ දී සිදුකර ඇති නමුත් අධ්‍යයන පීඨ පිහිටු වීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් නොවූ බැවින් පීඨ පිහිටු වීම සිදු වී නොමැත. මේවන විට එම අවශ්‍යතා සපුරා ඇති බැවින් අධ්‍යයන පීඨ පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර 2022.03.23 දින පැවති සනාතන සභාවේ නිර්දේශය 2022.05.24 දින පැවති 595 වැනි පාලක සභාව විසින් අනුමැතිය ලබාදී ඇත. අදාල ලියකියවිලි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් | ගැසට් නිවේදනය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | |
| (ආ)2018 පෙබරවාරි 20 දිනැති අංක 2018/03 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට පටහැනිව 2015 සැප්තැම්බර් මාසයේ සිට 2021 නොවැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී විශ්‍රාමික නිලධාරීන් 05 දෙනෙකු නැවත සේවයේ යොදවාගෙන 2020 හා 2021 වර්ෂ සඳහා පමණක් එකතුව රු.8,605,909 ක දීමනා ගෙවා තිබුණි. | පුරප්පාඩුවලට අදාළ බඳවාගැනීම් සිදුකිරීමට විශ්වවිද්‍යාලයට බලතල නොමැති හෙයින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ පත්කිරීම් සිදුකරන තෙක් විශ්වවිද්‍යාලයේ රාජකාරී බාධාවකින් තොරව පවත්වාගෙනයාම සඳහා කාර්යපැවරුම් පදනම මත මෙම නිළධාරීන්ගේ සේවය ලබාගැනීමට සිදුවීඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/ 19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | ජපන්රජයෙන් සෘජුවම විශ්ව විද්‍යාලය වෙත ලැබී තිබුණු රු.15,458,330 ක විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු නොකර උපයෝජනය කර තිබුණි. | නිවැරදි කර ඇත. 2020 වර්ෂයේ සිට සියලුම ප්‍රදානයන් සඳහා විදේශ සම්පත් දෙපාර්තුමේන්තුවේ අනුමැතිය ලබා ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.327,921,830 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 7,790,506 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.320,131,324 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.269,500,000 කින් වැඩිවීම හා සේවක පාරිතෝෂිත වෙන්කිරීම රු.128,382,475 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 3.1 අනාර්ථික ගනුදෙනු

-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහි පවත්වා තිබුණු බාහිර ආයතන 03 කින් අයකළ යුතු කුලිය තක්සේරු වාර්තා අනුව අය නොකිරීම හේතුවෙන් 2019 සැප්තැම්බර් සිට 2021 ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව රු.2,407,512 ක් අඩුවෙන් කුලී මුදල් අය කරගෙන තිබුණි. එසේම ගිවිසුම් අත්සන් කිරීමකින් හා කුලී අය කිරීමකින් තොරව රාජ්‍ය බැංකු ශාඛාවක් හා රාජ්‍ය බැංකු 02 ක ATM යන්ත්‍ර 02 ක් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ස්ථාපිත කිරීමට 2006 වර්ෂයේ සිට ඉඩ පහසුකම් සපයා තිබුණි. | බාහිර ආයතන 3 සම්බන්ධයෙන් හිඟමුදල් ඉක්මනින් ගෙවන මෙන් අදාළ පාර්ශවයන් වෙත දන්වා ඇත.<br>මහජන බැංකුවේ සේවා සැපයීම සඳහා සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ATM යන්ත්‍ර පහසුකම සැපයීම සඳහා විශ්වවිද්‍යාලයේ බිම් ප්‍රමාණයක් වෙන් කර තිබුනද, ඒ සම්බන්ධව අත්සන් කරන ලද බදු ගිවිසුමක් හෝ කුලී ගෙවීමක් පිළිබඳ තොරතුරු මෙතෙක් සොයා ගැනීමට අපහසු වූ බව දැන්වීමට කැමැත්තෙමි.<br>මෙම බැංකු සහ අනෙකුත් සේවා ස්ථාන සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නව තක්සේරු වාර්තා ලබා ගැනීමට දැනටමත් ඉල්ලීම් කර ඇති අතර නව තක්සේරු වාර්තා ලැබීමෙන් පසුව මෙම බැංකු සඳහා නව බදු ගිවිසුම් පිළියෙල කොට නිසියාකාරව පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. | අදාල පාර්ශවයන් සමග ගිවිසුම් අත්සන් කිරීමටත් ගිවිසුම්ගත පරිදි කුලී මුදල් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණු තනතුරු 08 ක් සඳහා මාස 06 සිට අවුරුදු 06 දක්වා කාලපරාසයක කොන්ත්‍රාත් හා කාර්ය පැවරුම් පදනම මත නිලධාරීන් 10 දෙනෙකු බඳවාගෙන 2020 ජනවාරි සිට 2021 නොවැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා වැටුප් ලෙස රු.21,869,071 ක් විශ්වවිද්‍යාලයීය අරමුදල් වලින් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලයේ කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා පාලක සභාවේ අනුමැතිය මත කොන්ත්‍රාත් හා කාර්ය පැවරුම් පදනම මත මෙම පත්කිරීම් සිදු කර ඇත. විශ්වවිද්‍යාලය විසින් උපයාගත් මුදලින් ගෙවීම් කරනු ලැබූ පත්වීම් වේ. | අත්‍යවශ්‍ය කාර්යමණ්ඩල පමණක් බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රීපාලි මණ්ඩපයට 2019 වර්ෂයේදී වැඩ ඉංජිනේරු (සිවිල්) – III ශ්‍රේණිය සඳහා නිලධාරියෙකු බඳවාගැනීමේදි සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන් දෙදෙනෙකුට සම්මුඛ පරීක්ෂණයේදි අඩු ලකුණු ලබා දී අඩු සුදුසුකම් සහිත අයදුම්කරුවෙකු බඳවාගෙන තිබුණි. | අනුමත කරන ලද ලකුණු ලේඛනයට අනුව මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේදී ලකුණු ලබා දී තිබුණි . තෝරා ගැනීම් කමිටු නිර්දේශය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම පත්වීම 2019දී සිදු කර ඇත. | විනිවිදභාවයෙන් යුතුව ලකුණු ලේඛන සකස් කර අනුමත කරවා ගෙන වඩාත්ම සුදුසු අයදුම්කරු බඳවාගැනීමට කටයුතු කළ යුතුය. |